# 2024
# පාර්ලිමේන්තු මැතිවරණය

පළමු අන්තර්කාලීන වාර්තාව (පූර්ව-මැතිවරණ සමය)

2024 ඔක්තෝබර් 30


PAFFREL

නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය

නො. 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06

+94 11 255 8570/71

paffrel@sltnet.lk

## අන්තර්ගතය

1. පසුබිම ........ 2

1.1 නාමයෝජනා ........ 3

1.2 මතභේදාත්මක තත්ත්ව ........ 4

2. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය ........ 6

2.1 පූර්ව-මැතිවරණ නිරීක්ෂණය ........ 6

2.1.1 තැපැල් ඡන්ද නිරීක්ෂණය ........ 6

2.1.2 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම ........ 7

2.2 මැතිවරණ දින නිරීක්ෂණය ........ 7

2.3 පශ්චාත්-මැතිවරණ නිරීක්ෂණය ........ 8

2.4 සමාජ මාධ්‍ය නිරීක්ෂණය කිරීම ........ 8

2.5 මැතිවරණ ප්‍රචාරණ වියදම් නිරීක්ෂණය ........ 8

3. පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකය ........ 10

3.1 මැතිවරණ පැමිණිලි ........ 10

3.2 මැතිවරණ නීති උල්ලංඝණය කිරීම ........ 11

3.3 රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන් අයුතු ලෙස භාවිතය ........ 11

3.4 ප්‍රචණ්ඩ ක්‍රියා ........ 11

4. දැනගෙන දෙන්න (Know Your Candidates) ........ 11

5. සියලු දෙනා ඇතුළත් කරගන්නා මැතිවරණයක් තහවුරු කිරීම ........ 12

6. ඡන්දදායකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ........ 12

7. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතාවගේ වගකීම ........ 13

පැෆ්රල් ප්‍රධාන කාර්යාලයේ (දිස්ත්‍රික් මට්ටමින්) පැමිණිලි භාර ගැනීමේ සහ මැදිහත්වීමේ මධ්‍යස්ථානයේ සම්බන්ධතා විස්තර ........ 13

ඇමතුම් තොරතුරු ........ 13

ඇමුණුම I - 2024/10/11 සිට 2024/10/30 දක්වා පාර්ලිමේන්තු මැතිවරණය ආශ්‍රිතව පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකයට ලැබුණු පැමිණිලි ........ 14

## වගු ලැයිස්තුව

වගුව 1 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ දිස්ත්‍රික්කවලින් තේරී පත් විය යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ........ 3

වගුව 2 පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලින් නාමයෝජනා භාරගැනීමේ තොරතුරු ........ 4

වගුව 3 ඔක්තෝබර් 12 සිට 30 දක්වා සමාජ මාධ්‍ය නිරීක්ෂණ සිද්ධි කාණ්ඩ සහ සිද්ධීන් ගණන ........ 8

වගුව 4 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් සීමාවන් ........ 9

## රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1 2024 ඔක්තෝබර් 11 සිට 28 දක්වා පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකයට ලැබුණු මැතිවරණ පැමිණිලි ........ 10

## 1. පසුබිම

1931 වසරේදී දකුණු ආසියාතික රටවල් අතරින් පළමු වරට ශ්‍රී ලංකාහට ඡන්ද බලය හිමි වූ අතර, එම වසරේදීම මහා මැතිවරණයක් ලෙස පළමු රාජ්‍ය සභා මැතිවරණය පැවැත්විණි. 1947 දී රටේ පළමු පාර්ලිමේන්තු මැතිවරණයට පෙර 1937 දී දෙවන රාජ්‍ය සභා මැතිවරණය පැවැත්විණි. 1952, 1956, 1960, 1965, 1970, සහ 1977 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වූ මහා මැතිවරණ සරල බහුතර මැතිවරණ ක්‍රමය මත පදනම් විය. මෙය පොදුවේ First-past-the-post (FPP) ලෙස හඳුන්වනු ලබන අතර, පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන අපේක්ෂකයින් විසින් නම් කරන ලද තනි අපේක්ෂකයන් සිටින මැතිවරණ කොට්ඨාශ මත පදනම් විය. 1978 වසරේ දී ශ්‍රී ලංකාවේ නව (දෙවන ජනරජ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සමානුපාතික මැතිවරණ ක්‍රමය හඳුන්වා දෙන ලදී. 1978 සිට 1988 දක්වා කාලය තුළ මෙම ක්‍රමයේ වෙනස්කම් ගණනාවක් සිදු කරන ලදී. 1988 න් පසු ශ්‍රී ලංකාවේ පැවති සෑම පාර්ලිමේන්තු මැතිවරණයක්ම (1989, 1994, 2000, 2001, 2004, 2010, 2015, සහ 2020 යන වසරවල) මෙම ක්‍රමය මත පදනම් විය. මෙම ක්‍රමය එයට පෙර ක්‍රියාත්මක වූ පළමු මනාප බහුත්ව ක්‍රමයට වඩා ප්‍රජාතන්ත්‍රවාදී බවක් පෙන්නුම් කරන්නේ දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට ලැබුණු ආසන සංඛ්‍යාව අත්‍යවශ්‍යයෙන්ම එයට ලැබුණු ඡන්ද සංඛ්‍යාවට සමානුපාතික වීම නිසාවෙනි. කෙසේ වෙතත්, මෙම ක්‍රමය රට පුරා තමන්ට සහයෝගය ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ පක්ෂවලට වාසියක් නිර්මාණය කර ඇත.

2020 වසරේදී පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සැළකිය යුතු බහුතරයක් ලබා ගත්තේය. මේ තුළ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ රජයට කොවිඩ්-19 වසංගතය, ආර්ථික අර්බුදය, මහජන විරෝධතා සහ 2022 වසරේ දී පැමිණි ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදය යනාදිය ඔවුනට මුහුණ දීමට සිදු වූ බහුවිධ ගැටලු ලෙස හඳුනාගත හැකිය.

2024 නොවැම්බර් 14 වන දින ශ්‍රී ලංකාව, නව පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් 225 දෙනෙකු තෝරා ගැනීම වෙනුවෙන් පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට සූදානම් වෙයි පවත්වනු ලබයි. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වැනි වගන්තියේ නියමයන්ට අනුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වැනි ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට පැවරී ඇති ඇති බලතල අනුව, ජනාධිපතිවරයා විසින් නිකුත් කළ අංක. 2403/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2024 සැප්තැම්බර් 24 මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සිදු වූ අතර, 2024 නොවැම්බර් 21 වැනි දින නව පාර්ලිමේන්තුව රැස්විය යුතු බවට නියම කරන ලදී. 2024 නොවැම්බර් 14 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ දිනය ලෙස ද නියම කර ඇත. කෙසේ වෙතත්, වත්මන් පාර්ලිමේන්තුවේ නිල කාලය ලබන වසරේ අගෝස්තු මාසයේදී අවසන් වීමට නියමිතව තිබුණි.

2024 ශ්‍රී ලංකා ජනාධිපතිවරණයේදී ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක මහතා 42.31% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ශ්‍රී ලංකාවේ නවවැනි විධායක ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූයේ ජනාධිපතිවරණයේදී ඡන්ද ලක්ෂ 56කට අධික ඡන්ද සංඛ්‍යාවක් ලබා ගනිමිනි. අනුර කුමාර දිසානායක මහතා සැප්තැම්බර් 23 වන දින ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන් අතර, ඔහු විසින් සැප්තැම්බර් 24 වැනි දින නව අග්‍රාමාත්‍යවරයා ලෙසා හිටපු පාර්ලිමේන්තු සාමාජිකා (ජාතික ලැයිස්තුවේ) හරිනි අමරසූරිය පත් කරනු ලැබීය. ඇය මෙම තනතුරට පත් තෙවැනි කාන්තාවයි. ජනාධිපතිවරයා මීළඟ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම දක්වා කාලය සඳහා කටයුතු කිරීමට භාරකාර ආණ්ඩුවක් පිහිටුවන අතර, මෙය ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරිය සහ එක් අමාත්‍යවරයෙක් සහිතව ත්‍රිපුද්ගල කැබිනට් මණ්ඩලයකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාවේ ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණය විශේෂයෙන් වැදගත් වන්නේ එය දේශපාලන වෙනසක් සහ ප්‍රතිසංස්කරණ සඳහා තීරණාත්මක අවස්ථාවක් සනිටුහන් කරන බැවිනි. 2024 ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායකගේ ජයග්‍රහණයෙන් පසුව, මෙම මැතිවරණය ජාතික ජන බලවේගයට ව්‍යවස්ථාදායකය තුළ තම බලය වැඩි කර ගැනීමට සහ රටේ දේශපාලන පසුබිම නැවත සකස් කිරීමට අවස්ථාවක් සපයයි. වර්තමාන ආර්ථික අර්බුදය සමග මෙම මැතිවරණය පැමිණෙන්නේ පුරවැසියන්ට ඉතා තීරණාත්මකය. බොහෝ දෙනා මෙම මැතිවරණය සළකන්නේ, දැනට පවතින ආර්ථික අභියෝගවලට මුහුණ දීමටත්, ණය අර්බුදය විසඳා ගැනීමටත්, පාලනය කෙරෙහි මහජන විශ්වාසය යළි ඇති කිරීමටත් හැකි නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ අවස්ථාවක් ලෙසය.

2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඡන්දදායකයින් 17,140,354 ක් සුදුසුකම් ලබා ඇත. වැඩිම ඡන්දදායකයින් සංඛ්‍යාවක් සිටින්නේ ගම්පහ දිස්ත්‍රික්කයේවන අතර, එහි මුළු ඡන්දදායකයින් සංඛ්‍යාව 1,881,129 කි. ඡන්දදායකයින් 306,081 ක් සිටින වන්නි දිස්ත්‍රික්කය අඩුම ඡන්දදායකයින් ප්‍රමාණයක් සිටින දිස්ත්‍රික්කය වේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දෙනා තෝරාගනු ලබන්නේ වසර 05ක නිල කාලයක් සඳහාය. මැතිවරණයේදී ඡන්දදායකයාට දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමට සිය ඡන්දය ප්‍රකාශ කළ හැකි අතර, ඉන්පසුව එම දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයන් තිදෙනෙකු දක්වා මනාප ලකුණු කළ

හැකිය. අවශ්‍ය නම් මනාප සළකුණු නොකර, දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට පමණක් ඡන්දය සලකුණු කිරීමේ හැකියාව තිබේ. 05% සීමාවක් සහිතව විවෘත ලැයිස්තු සමානුපාතික නියෝජන ක්‍රමයක් භාවිතා කරමින් බහු ආසන 22 කින් සාමාජිකයින් 196 දෙනෙකු තෝරා ගනු ලැබේ. ඉතිරි ආසන 29 ජාතික ලැයිස්තුව හරහා තෝරා ගනු ලබයි.

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024/09/25 දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් නම් කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව දැනුම් දෙන ලදී. ඒ අනුව වැඩිම මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් (19ක්) තේරී පත්වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන්වන අතර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් අඩුම මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් (04) තේරී පත් වෙයි.

| අංකය | මැතිවරණ දිස්ත්‍රික්කයේ නම සහ අංකය | තේරී පත් විය යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 18 |
| 02 | ගම්පහ | 19 |
| 03 | කළුතර | 11 |
| 04 | මහනුවර | 12 |
| 05 | මාතලේ | 05 |
| 06 | නුවරඑළිය | 08 |
| 07 | ගාල්ල | 09 |
| 08 | මාතර | 07 |
| 09 | හම්බන්තොට | 07 |
| 10 | යාපනය | 06 |
| 11 | වන්නිය | 06 |
| 12 | මඩකලපුව | 05 |
| 13 | දිගාමඩුල්ල | 07 |
| 14 | ත්‍රිකුණාමලය | 04 |
| 15 | කුරුණෑගල | 15 |
| 16 | පුත්තලම | 08 |
| 17 | අනුරාධපුරය | 09 |
| 18 | පොලොන්නරුව | 05 |
| 19 | බදුල්ල | 09 |
| 20 | මොණරාගල | 06 |
| 21 | රත්නපුර | 11 |
| 22 | කෑගල්ල | 09 |
| | **එකතුව** | **196** |

*වගුව 1 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ දිස්ත්‍රික්කවලින් තේරී පත් විය යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව*

ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාව, 2024 මගින් ලබා ගන්නා ලදී

මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024 සැප්තැම්බර් 25 දින චක්‍රලේඛයක් (PE/2024/03) ප්‍රකාශයට පත් කරන ලද්දේ දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් හෝ අපේක්ෂකයින් අගතියට පත් කරන ආකාරයේ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ උසස් කිරීම සහ සේවකයන්ගේ පත්වීම් සීමා කිරීම, නාමයෝජනා දැනුම්දීමේ දිනයේ සිට මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශනය අවසන් වන කාලය දක්වා ස්ථාන මාරු කිරීම් සීමා කිරීම වැලැක්වීම යනාදී සඳහා රාජ්‍ය දේපළ පාලනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය දේපළ පරිපාලනය භාරව සිටින සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම සඳහා ය.

## 1.1 නාමයෝජනා

අංක 2403/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නාමයෝජනා භාරගැනීමේ කාලය වූයේ 2024 ඔක්තෝබර් 4 සිට 2024 ඔක්තෝබර් 11 වැනි දින මධ්‍යහන 12 දක්වා කාලයයි. විශේෂයෙන් මැතිවරණ කොමිෂන් සභාව අවධාරණය කළේ, සියලු ජනවාර්ගික කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් නියෝජනයක් තිබිය යුතු බවත්, ජාතික ලැයිස්තු සඳහා අපේක්ෂකයින් නම් කිරීමේදී ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් සළකා බැලිය යුතු බවත්ය. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුව ජාතික ලැයිස්තු අපේක්ෂකයින්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ජාතික ලැයිස්තු සමඟ මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව නිවේදනය කෙරේ. 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ලැබී ඇති නාමයෝජනාවල සංශෝධිත වාර්තාවට (24/10/2024) අනුව, ලියාපදිංචි දේශපාලන පක්ෂ නියෝජනය කරමින්

5,531 ක් සහ ස්වාධීන කණ්ඩායම් 3357 ක් සමග අපේක්ෂකයින් 8888 ක් මැතිවරණයට ඉදිරිපත් වනු ඇත. ඉදිරිපත් වූ නාමයෝජනා 788 න්, 719ක් පිළිගෙන ඇති අතර 69ක් ප්‍රතික්ෂේප විය.

| මැතිවරණ කොට්ඨාසය | පිළිගත් දේශපාලන පක්ෂ නාමයෝජනා | | | ස්වාධීන කණ්ඩායම් නාමයෝජනා | | | මුළු නාමයෝජනා | | | මුළු අපේක්ෂක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ලැබුණු | පිළිගත් | ප්‍රතික්ෂේප | ලැබුණු | පිළිගත් | ප්‍රතික්ෂේප | ලැබුණු | පිළිගත් | ප්‍රතික්ෂේප | දේශපාලන පක්ෂ | ස්වාධීන කණ්ඩායම් | එකතුව |
| කොළඹ | 28 | 27 | 1 | 22 | 19 | 3 | 50 | 46 | 4 | 567 | 399 | 966 |
| ගම්පහ | 24 | 24 | 0 | 18 | 17 | 1 | 42 | 41 | 1 | 528 | 374 | 902 |
| කළුතර | 20 | 17 | 3 | 14 | 11 | 3 | 34 | 28 | 6 | 238 | 154 | 392 |
| මහනුවර | 22 | 22 | 0 | 12 | 12 | 0 | 34 | 34 | 0 | 330 | 180 | 510 |
| මාතලේ | 17 | 16 | 1 | 7 | 7 | 0 | 24 | 23 | 1 | 128 | 56 | 184 |
| නුවරඑළිය | 20 | 17 | 3 | 15 | 11 | 4 | 35 | 28 | 7 | 187 | 121 | 308 |
| ගාල්ල | 17 | 17 | 0 | 6 | 5 | 1 | 23 | 22 | 1 | 204 | 60 | 264 |
| මාතර | 16 | 15 | 1 | 7 | 7 | 0 | 23 | 22 | 1 | 150 | 70 | 220 |
| හම්බන්තොට | 17 | 16 | 1 | 9 | 9 | 0 | 26 | 25 | 1 | 160 | 90 | 250 |
| යාපනය | 23 | 23 | 0 | 22 | 21 | 1 | 45 | 44 | 1 | 207 | 189 | 396 |
| වන්නි | 24 | 23 | 1 | 27 | 25 | 2 | 51 | 48 | 3 | 207 | 225 | 423 |
| මඩකලපුව | 23 | 22 | 1 | 31 | 27 | 4 | 54 | 49 | 5 | 176 | 216 | 392 |
| දිගාමඩුල්ල | 22 | 21 | 1 | 50 | 43 | 7 | 72 | 64 | 8 | 210 | 430 | 640 |
| ත්‍රිකුණාමලය | 20 | 17 | 3 | 17 | 14 | 3 | 37 | 31 | 6 | 119 | 98 | 217 |
| කුරුණෑගල | 22 | 18 | 4 | 9 | 9 | 0 | 31 | 27 | 4 | 324 | 162 | 486 |
| පුත්තලම | 26 | 24 | 2 | 18 | 15 | 3 | 44 | 39 | 5 | 264 | 165 | 429 |
| අනුරාධපුර | 18 | 17 | 1 | 9 | 9 | 0 | 27 | 26 | 1 | 204 | 108 | 312 |
| පොලොන්නරුව | 14 | 13 | 1 | 2 | 2 | 0 | 16 | 15 | 1 | 104 | 16 | 120 |
| බදුල්ල | 19 | 15 | 4 | 6 | 5 | 1 | 25 | 20 | 5 | 180 | 60 | 240 |
| මොණරාගල | 13 | 12 | 1 | 3 | 3 | 0 | 16 | 15 | 1 | 108 | 27 | 135 |
| රත්නපුරය | 19 | 18 | 1 | 7 | 7 | 0 | 26 | 25 | 1 | 252 | 98 | 350 |
| කෑගල්ල | 19 | 14 | 5 | 5 | 4 | 1 | 24 | 18 | 6 | 168 | 48 | 216 |
| **එකතුව** | **443** | **408** | **35** | **316** | **282** | **34** | **759** | **690** | **69** | **5015** | **3346** | **8361** |
| **ජාතික ලැයිස්තුව** | **27** | **27** | **0** | **2** | **2** | **0** | **29** | **29** | **0** | **516** | **11** | **527** |
| **මුළු එකතුව** | **470** | **435** | **35** | **318** | **284** | **34** | **788** | **719** | **69** | **5531** | **3357** | **8888** |

*වගුව 2 පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලින් නාමයෝජනා භාරගැනීමේ තොරතුරු*

වැඩිම අපේක්ෂකයින් සංඛ්‍යාවක් (966) කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් අපේක්ෂකයින් සිටින්නේ 120ක් පමණි. දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශයෙන් වැඩිම නාමයෝජනා පත්‍ර සංඛ්‍යාවක් එනම් නාමයෝජනා පත්‍ර 72 ක් ලැබී ඇති අතර, ඉන් 64ක් පිළිගෙන ඇති අතර නාමයෝජනා පත්‍ර 08ක් ප්‍රතික්ෂේප වී ඇත. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ ද නාමයෝජනා පත්‍ර 07ක් ප්‍රතික්ෂේප වී ඇත.

නොවැම්බර් 14 වැනිදාට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන සියලුම අපේක්ෂකයන් තම වත්කම් බැරකම් ප්‍රකාශයන් නාමයෝජනා පත්‍ර සමඟ දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු බව මැතිවරණ කොමිෂන් සභාව අවධාරණය කරයි. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුව පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් දෙකේම අපේක්ෂකයින්ට මෙය අදාළ වේ. මීට අමතරව, එහි 99 අ වගන්තිය යටතේ ජාතික ලැයිස්තු මන්ත්‍රී අපේක්ෂකයින් ද තම වත්කම් සහ බැරකම් ප්‍රකාශ නාමයෝජනා පත්‍ර සමග ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රකාශ ලබාදීමට අපොහොසත් වීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සළකන බව මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා අවධාරණය කළේය.

## 1.2 මතභේදාත්මක තත්ත්ව

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේදී හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ, වාසුදේව නානායක්කාර, චමල් රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන (හිටපු ජනාධිපති), විජයදාස රාජපක්ෂ (පසුගිය ජනාධිපතිවරණ අපේක්ෂක), සී.වී. විග්නේෂ්වරන් (දෙමළ ජනතා ජාතික සන්ධානය), විමල් වීරවංශ (ජාතික නිදහස් පෙරමුණ), චම්පික රණවක (සමගි ජන බලවේගය), මහින්ද රාජපක්ෂ (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ), බැසිල් රාජපක්ෂ (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ), විමලවීර දිසානායක (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ), සරත් ෆොන්සේකා (හිටපු ජනාධිපතිවරණ අපේක්ෂකයෙක්) ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 59 දෙනෙකු මැතිවරණයකට තරග කිරීම ඉදිරිපත් නොවීම විශේෂත්වයකි.

මෙවර මැතිවරණය සඳහා ඉදිරිපත් වූ නාමයෝජනා පත්‍ර අතරින් කිහිපයක් ප්‍රතික්ෂේප විය. ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ක්‍රියාකරුවෙකුවන අශේන් සේනාරත්න මහතා කොළඹ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින්

මැතිවරණයට නාමයෝජනා භාරදුණි. ඔහුගේ නාමයෝජනා පත්‍රය මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර එය සුදුසුකම් නොලත් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කළ බව සඳහන් කිරීම ප්‍රතික්ෂේප වීමට හේතු විය. මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව ඔහු සමාජ මාධ්‍ය හරහා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. කෙසේ වෙතත්, නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වීම හේතුවෙන් කිසියම් පාර්ශ්වයකට හෝ පුද්ගලයෙකුට අසාධාරණයක් සිදුවී ඇත්නම්, ඒ වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි බව මැතිවරණ කොමිෂන් සභාව මෙහිදී පැහැදිලිවම ප්‍රකාශ කළේය.

සමගි ජන බලවේගයේ ලැයිස්තුවෙන්, රංගන ශිල්පිනී දමිතා අබේරත්න රත්නපුර මැතිවරණ දිස්ත්‍රික්කයෙන් මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වීමට අපේක්ෂා කළද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සමගි ජන බලවේගයෙන් යවන ලද අයදුම්කරුවන්ගේ ලැයිස්තුවේ ඇයගේ නම ඇතුළත් වී නොතිබුණි .

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම ගම්පහ මැතිවරණ දිස්ත්‍රික්කයට නාමයෝජනා දීමෙන් පසු දින සමගි ජන බලවේගයෙන් ඉල්ලා අස්වී, පාර්ලිමේන්තු මැතිවරණ තරගයෙන් ඉවත් විය. ඔහු සමගි ජන බලවේගයේ ගම්පහ ආසනයේ ප්‍රධාන සංවිධායක ධුරයෙන් තමන්ව ඉවත් කිරීම හේතුවෙන් මෙම තීරණය ගත් බව අවධාරණය කළේය.

පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව මූලික අයිතිවාසිකම් පෙත්සම් රැසක් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලැබී තිබේ. කෙසේ වෙතත්, මැතිවරණයට අදාළ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ තීරණයට එරෙහිව ඉදිරිපත් වූ මූලික අයිතිවාසිකම් පෙත්සම් පහෙන් හතරක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේපකොට ඇත.

ප්‍රීති පද්මන් සූරසේන, අචල වෙන්ගප්පුලි සහ ප්‍රියන්ත ප්‍රනාන්දු යන විනිසුරුවරුන්ගෙන් සමන්විත විනිසුරු මඩුල්ල විසින් වන්නි දිස්ත්‍රික්කය සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ නාමයෝජනා භාර ගන්නා ලෙස මැතිවරණ කොමිසම වෙත නියෝග කරන ලද අතර, එය මීට පෙර දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරියා විසින් ප්‍රතික්ෂේප විය. කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී ජාතික හඬ කෑගල්ල දිස්ත්‍රික්කයට ඉදිරිපත් කළ නාමයෝජනා, සිංහල දීප ජාතික පෙරමුණ විසින් පුත්තලම සහ බදුල්ල දිස්ත්‍රික්ක සඳහා ඉදිරිපත් කළ නාමයෝජනා සහ සහ යූටියුබර් සමාජ ජාල ක්‍රියාකාරී අශේන් සේනාරත්න, කොළඹ දිස්ත්‍රික්කය සඳහා ඔහුගේ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා වෙනුවෙන් ඉදිරිපත් වූ පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කළේය.

එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී හඬ පක්ෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයට තරග වදින, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතාගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන්ද ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබූ නඩුවක් මතභේදයට හේතු විය.ගම්පහ දිස්ත්‍රික්කයේ ස්වාධීන අපේක්ෂකයෙකුවන කේ.එම්. මහින්ද සේනානායක මහතා මෙම පෙත්සම ඉදිරිපත් කළේය.

ඊට අමතරව, එළඹෙන නොවැම්බර් 14 වැනිදා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට ගත් තීරණයට එරෙහිව සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු සහ "අපි ශ්‍රී ලංකා" සංවිධානයේ සංවිධායක ප්‍රියන්ත හේරත් මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කළ අතර, මෙහි වග උත්තරකරුවන් ලෙස නීතිපතිවරයා, ජනාධිපති ලේකම්වරයා, මැතිවරණ කොමිසමේ සභාපතිවරයා සහ එහි සාමාජිකයන් ද නම් කරනු ලැබ ඇත.

පාර්ලිමේන්තු මැතිවරණ මැතිවරණ පනතේ 10 වැනි වගන්තියට අනුව ඔක්තෝබර් 4 සිට 11 දක්වා නාමයෝජනා භාර ගන්නා ලදී. අවම වශයෙන් සති පහක්වත් නාමයෝජනා භාරගැනීමේ කාලසීමාවට පසුව සති හතකට නොඅඩු කාලයක් තුළ ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බවට පනතට අනුව එය අවශ්‍යවන බව පෙත්සමෙන් කරුණු දක්වයි.

සති පහක නිල කාලය නොවැම්බර් 15 දිනෙන් අවසන් වන අතර, සති හතක කාලය නොවැම්බර් 29 දිනෙන් අවසන් වන බව පෙත්සමේ සඳහන් වන්නේ නාමයෝජනා ක්‍රියාවලිය ඔක්තෝබර් 11 වනදා අවසන් වූ නිසායි. එබැවින් පෙත්සම්කරු තර්ක කරන්නේ එය නීත්‍යානුකූලව අවශ්‍ය කාල පරාසයෙන් පිටත බැවින්, පාර්ලිමේන්තු මැතිවරණය නොවැම්බර් 14 වැනිදා පැවැත්වීමට සැලසුම් කිරීම නීති විරෝධී බවයි.

නොවැම්බර් 14 වනදා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට ගත් තීරණය නීති විරෝධී ලෙස ප්‍රකාශ කරන ලෙස ඉල්ලා ගොනු කළ මෙම පෙත්සම නොවැම්බර් 04 වැනිදා අධිකරණය විසින් සමාලෝචනය කිරීමට නියමිතය. මෙම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අර්ජුන ඔබේසේකර මහතා හමුවට කැඳවූ අවස්ථාවේදී මෙම පෙත්සම සම්බන්ධයෙන් විරෝධතා ඇත්නම් ඔක්තොම්බර් 28 වන දිනට ඉදිරිපත් කරන ලෙස අධිකරණය වගඋත්තරකරුවන්ට දැනුම් දී ඇත.

## 2. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය

පැෆ්රල් සංවිධානය විසින් පසුගිය 2024 ජනාධිපතිවරණයේදී සිය මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය සාර්ථකව නිම කළ අතර, සමාලෝචන ක්‍රියාවලියක් හරහා එහි උගත් පාඩම් පිළිබඳව සාකච්ඡාවට බඳුන් කළේය. එමෙන්ම, ජනාධිපතිවරණය නිරීක්ෂණ කටයුතුවල දී එම නිරීක්ෂණ කටයුතු හොඳින් සිදු කළ සහ වාර්තාකරණයේ නිරත වූ දීර්ඝ කාලීන නිරීක්ෂකයින් සහ ඔවුන් හා සම්බන්ධීකරණයේ නිරත වූ දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් සමග පාර්ලිමේන්තු මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා යොදාගැනීම පිළිබඳව සමාලෝචනයකද නිරත විය.

2024 පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, පැෆ්රල් සංවිධානය විසින් පුළුල් මැතිවරණ නිරීක්ෂණ ව්‍යාපාරයක් ආරම්භ කල අතර එය පහත ආකාරයට අදියර තුනකින්; පූර්ව-මැතිවරණ නිරීක්ෂණය, මැතිවරණ දින නිරීක්ෂණය සහ පශ්චාත් මැතිවරණ නිරීක්ෂණ ලෙස ක්‍රියාත්මක කෙරේ. මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියේ අරමුණු පහත පරිදි වේ:

- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම, ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය කිරීම, වාර්තා කිරීම, වැළැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සහාය වීම.
- මැතිවරණ නීත්‍යානුකූල සහ ඡන්දදායකයින් විසින් පිළිගන්නා බව සහතික කිරීම සඳහා මැතිවරණ පාර්ශවකරුවන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- මැතිවරණයෙන් ඔබ්බට ක්‍රියාශීලී වීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී සහ පාලන ක්‍රියාවලීන්ට සම්බන්ධ වීමට මහජනතාවගේ ඉහළ මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීම.

පැෆ්රල් සංවිධානය සිය මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය දිවයින පුරා දියත් කරන අතර, දිගුකාලීන නිරීක්ෂකයින් 160 දෙනෙක්, ස්ථානගත නිරීක්ෂකයින් 3000 ක්, ජංගම කණ්ඩායම් 320 ක් හරහා ජංගම කණ්ඩායම් නිරීක්ෂකයින් 1280 දෙනෙක්, ජංගම ඒකක 06 ක් හරහා විශේෂ ජංගම නිරීක්ෂකයින් 24 දෙනෙක්, තැපැල් ඡන්ද නිරීක්ෂකයින් 1000 ක්, ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 200 දෙනෙක්, ප්‍රචාරක මූල්‍ය අධීක්ෂණ නිරීක්ෂකයින් 32 දෙනෙක් සහ මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 25 දෙනෙක් යෙදවීමට සැලසුම් කරයි. මීට අමතරව, දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 30 දෙනෙක්, දිස්ත්‍රික් ගිණුම් නිලධාරීන් 30 දෙනෙක් සහ ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 26 දෙනෙක් යෙදවීමට පැෆ්රල් සංවිධානය සැලසුම් කරයි. මෙවර මැතිවරණයට අපේක්ෂකයින් 8,000 කට අධික සංඛ්‍යාවක් ඉදිරිපත් වීම හේතුවෙන් 2024 ජනාධිපතිවරණ සමයේදී පැෆ්රල් සංවිධානය විසින් යෙදවූ මැතිවරණ නිරීක්ෂකයින් සංඛ්‍යාවට වඩා වැඩි නිරීක්ෂකයන් සංඛ්‍යාවක් යෙදවීමට සැලසුම් කොට ඇත.

### 2.1. පූර්ව-මැතිවරණ නිරීක්ෂණය

පැෆ්රල් සංවිධානය විසින් දිස්ත්‍රික් මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන සමග සම්බන්ධ වී, පූර්ව-මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදු කරයි. දිවයිනේ සෑම ඡන්ද දිස්ත්‍රික්කයක්ම ආවරණය කිරීම සඳහා පැෆ්රල් සංවිධානය විසින් දිගුකාලීන නිරීක්ෂකයින් 160ක් යොදවා ඇත. රාජ්‍ය සම්පත් අවභාවිතය, මැතිවරණ නීති සහ රෙගුලාසි උල්ලංඝණය කිරීම, මැතිවරණ කොමිසමේ මැතිවරණ සූදානම, අපේක්ෂකයින්ගේ ප්‍රචාරක රැළිවල ක්‍රියාකාරීත්වය, සුළුතර හෝ ආන්තික ප්‍රජාවන්ට එරෙහිව සිදු කරන අපහාසාත්මක ක්‍රියා හෝ කතා හෝ ප්‍රචාර පිළිබඳ ඇතුළුව ඕනෑම අක්‍රමිකතාවක් නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට මෙම දිගුකාලීන නිරීක්ෂකයින් පුහුණුව ලබා ඇත.

#### 2. 1. 1 තැපැල් ඡන්ද නිරීක්ෂණය

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26 වගන්තියේ විධිවිධාන වලට අනුව 2024 නොවැම්බර් 14 වැනි දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ පහසුකම් ඉල්ලීමට හිමිකම් ඇති ඡන්ද හිමියන් වෙත එනම්, ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල නිරත වීම හෝ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු වෙනත් අත්‍යවශ්‍ය සේවාවල නිරත වීම හේතුවෙන් තමාට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට නොහැකි වීමට ඉඩ ඇති ඡන්ද හිමියන් සඳහා තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් සැලසිය යුතු වේ. මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024 සැප්තැම්බර් 29 වන දින, තැපැල් ඡන්දය සඳහා අයදුම්පත් භාර ගැනීම 2024/10/01 දින ආරම්භ කරන බවත්, 2024/10/08 දිනෙන් අයදුම්පත් භාර ගැනීම අවසන් කරන බවත් ප්‍රකාශ කළේය. කෙසේ වෙතත්, නැවත වරක් මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කාලසීමාව 2024/10/10 දින මධ්‍යම රාත්‍රිය දක්වා දීර්ඝ කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවට අනුව, ලැබුණු මුළු තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාවෙන් (759,210) තැපැල් ඡන්ද අයදුම්පත් 21,160 ක් ප්‍රතික්ෂේප වී ඇති අතර එයින් 738,050 ක් පිළිගෙන ඇත. මෙය පසුගිය ජනාධිපතිවරණය සඳහා ලැබුණු තැපැල් ඡන්ද සංඛ්‍යාවට වඩා 25,731 කින් වැඩිය.

ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම 2024 ඔක්තෝබර් 30, 2024 නොවැම්බර් 01 සහ 04 යන දිනවල සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ මැතිවරණ කාර්යාලවලදී සිදු කෙරේ. මෙම දිනවල තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූවන් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024 නොවැම්බර් 07 සහ 08 යන අතිරේක දිනයන් නියම කර ඇත. තැපැල් ඡන්ද හිමි නාමලේඛන සහතික කිරීම 2024/10/16 දින සිදු වූ අතර, මෙම ලැයිස්තු නිකුත් කිරීම සහ තැපැල් කාර්යාල වෙත භාරදීම 2024/10/23 දින සිදු විය. මීට අමතරව, නිල ඡන්ද පත්‍රිකා තැපැල් කාර්යාල වෙත භාරදීම 2024/10/26 දිනට සැලසුම්කොට තිබිණි . නිල ඡන්ද කාඩ්පත් බෙදා හැරීම සඳහා 27/10/2024, 31/10/2024, සහ 03/11/2024 යන විශේෂ දින නියම විය. මැතිවරණ කොමිෂන් සභාව විසින් විසින් තහවුරු කරන ලද පරිදි නිල ඡන්ද පත්‍රිකා බෙදා හැරීමේ අවසාන දිනය 2024 නොවැම්බර් 07 වැනිදාය.

තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දිනවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, බස් ඩිපෝ, අධ්‍යාපන කාර්යාල, හමුදා කඳවුරු, මැතිවරණ දිනයට යෙදවීමට නියමිත රාජ්‍ය නිලධාරීන් විශාල සංඛ්‍යාවක් සිටින පොලිස් ස්ථාන වැනි දේශපාලනිකව සංවේදී මධ්‍යස්ථාන සඳහා පැෆ්රල් සංවිධානය මගින් නිරීක්ෂකයන් 1000ක් යෙදවීමට නියමිතයි.

### 2. 1. 2 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම

මැතිවරණ කොමිෂන් සභාව, දේශපාලන පක්ෂ සහ මැතිවරණ නිරීක්ෂණ ආයතන වැනි මැතිවරණයට සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් මැතිවරණ ආරවුල් විසඳීම සහ අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් වර්ෂ 2001 දී පැෆ්රල් සංවිධානයේ මූලිකත්වයෙන් දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණය මධ්‍යස්ථාන (මීට පෙර හැඳින්වූයේ සර්ව පාක්ෂික මෙහෙයුම් ඒකක ලෙසිනි) පිහිටුවන ලදී. මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024/10/16 දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කර දිස්ත්‍රික් මට්ටමින් මැතිවරණ ආරවුල් නිරාකරණය මධ්‍යස්ථාන ඒකකවල ලිපිනයන් සහ දුරකථන අංක ඇතුළු තොරතුරු ප්‍රකාශයට පත් කරන ලදී. 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා, 2024 ඔක්තෝබර් 24 වැනි දින සිට, මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කොට සතියක් ගතවන තුරු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් විසඳීමේ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරයි.

දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණය මධ්‍යස්ථාන, මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් හෝ මැතිවරණ කටයුතුවලට බාධා කිරීම් සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වවලින් ලැබෙන පැමිණිලි සඳහා වහා මැදිහත් වේ. මෙම පැමිණිලි ඵලදායී ලෙස කළමනාකරණය කිරීම, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට බාධා වළක්වා ගැනීම සහ ඒවා යළි ඇති නොවීමට වගබලා ගැනීම, මැතිවරණය ආශ්‍රිත සිදුවීම්වලින් විපතට පත් වූවන්ට සහන සැලසීම සහ තරග කරන සියලුම පාර්ශ්වයන්ට සමාන අවස්ථා සහතික කිරීම ආදිය දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණය මධ්‍යස්ථානවල ප්‍රධාන අරමුණු වේ. පැෆ්රල් සංවිධානය විසින් දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණය මධ්‍යස්ථාන ක්‍රියාවලීන් ආවරණය කිරීම සඳහා දිස්ත්‍රික් නිරීක්ෂකයින් 25 දෙනෙකු දිස්ත්‍රික්ක 25 තුළම යොදවා ඇති අතර, මෙම නිරීක්ෂකයින් දිනපතා කොළඹ පැෆ්රල් සංවිධානයේ ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කරයි.

### 2. 2 මැතිවරණ දින නිරීක්ෂණය

ඡන්ද විමසීමේ දිනයේදී නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා අවශ්‍ය පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා, ස්ථානගත නිරීක්ෂකයින් 3000 ක්, ජංගම නිරීක්ෂක ඒකක 330 ක් සහ දිගුකාලීන නිරීක්ෂකයින් 160 ක් ඇතුළුව නිරීක්ෂකයින් 5862 ක් පමණ යෙදවීමට පැෆ්රල් සංවිධානය සැලසුම් කර ඇත. තවද, පෙර තීරණය කළ අවදානම් ප්‍රදේශ වෙත විශේෂ ජංගම ඒකක 06ක් යෙදවීමට පැෆ්රල් සංවිධානය සැලසුම් කර ඇත. එසේම, ගණන් කිරීමේ නිරීක්ෂකයින් 200 ක්, දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 30 ක් සහ ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 26 ක් ඡන්ද විමසීම පැවැත්වෙන දිනයේදී ක්ෂේත්‍රයේ රැඳී සිටිති.

## 2. 3 පශ්චාත්-මැතිවරණ නිරීක්ෂණය

පාර්ලිමේන්තු මැතිවරණයේ නිල ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, පශ්චාත් මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදු කෙරෙන අතර, එහි අරමුණ වන්නේ යහපත් ප්‍රජාතන්ත්‍රවාදයේ තවත් කැපී පෙනෙන සලකුණක්වන සාමකාමී සහ සුමට බල සංක්‍රමණයක් දක්වා එය අඛණ්ඩව පවත්වාගෙන යෑමයි. මෙම කාල පරිච්ඡේදය තුළ ප්‍රධාන වශයෙන් නිරීක්ෂණ කටයුතු සිදු කරන්නේ දිගුකාලීන නිරීක්ෂකයින් විසිනි.

## 2. 4 සමාජ මාධ්‍ය නිරීක්ෂණය කිරීම

2015 සිට හැශ්ටැග් පරපුර සහ මැතිවරණ කොමිෂන් සභාව සමග ඇති කරගත් දීර්ඝ කාලීන විශ්වාසනීය සමාජ මාධ්‍ය නිරීක්ෂණ යාන්ත්‍රණ හවුල්කාරිත්වය ඔස්සේ පැෆ්රල් සංවිධානය විසින් මැතිවරණවලදී අඛණ්ඩව සමාජ මාධ්‍ය නිරීක්ෂණය සිදු කරන ලදී. මෙම සන්දර්භය තුළ, පැෆ්රල් සංවිධානය හැශ්ටැග් පරපුර සමග හවුල්ව, පාර්ලිමේන්තු මැතිවරණයට පෙර, මැතිවරණය පැවැත්වෙන අතරතුර සහ ඉන්පසුව,ඉලක්කගත ලෙස Facebook සමාජ ජාලයෙහි මැතිවරණ නීති උල්ලංඝනය කිරීම්, වැරදි තොරතුරු සහ වෛරී ප්‍රකාශ හඳුනාගැනීම් අරමුණු කරගත් බහුවිධ උපාය මාර්ගයක් ක්‍රියාවට නැංවීමට ඉලක්කගතව මැදිහත් වේ.

වෛරී ප්‍රකාශ, වැරදි තොරතුරු, මහජනතාව නොමග යවන සහ අවුල් වියවුල් ඇති කළ හැකි නුසුදුසු පැහැදිලි කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා කණ්ඩායමක් යොදවා ඇති අතර, ඒවා අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මැතිවරණ කොමිෂමේ අවධානයට යොමු කරනු ඇත. මැතිවරණ කොමිෂමේ අවධානයෙන් පසුව අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මෙම සිදුවීම් ශ්‍රී ලංකාවේ Facebook සමාජ ජාලයේ නියෝජිතයන් වෙත යොමු කිරීමට නියමිතය.

පැෆ්රල් සංවිධානය විසින් 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා සමාජ මාධ්‍ය හරහා පූර්ව මැතිවරණ නිරීක්ෂණ කටයුතු මේවන විට ආරම්භ කර ඇති අතර, සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව දිනපතා මැතිවරණ කොමිසමට වාර්තා කරයි.

2024 ඔක්තෝම්බර් 12 සිට ඔක්තෝබර් 30 දක්වා මෙම කණ්ඩායම විසින් සමාජ මාධ්‍ය නිරීක්ෂණය කළ අතර, ෆෙස්බුක්හි සිද්ධීන් 46 ක්, TikTokහි සිද්ධීන් 08 ක් සහ YouTubeහි සිද්ධීන් 02 ක් නිරීක්ෂණය කරන ලදී. එසේම මෙම සිද්ධීන් පහත කාණ්ඩවලට යටත් වේ:

| අංකය | සිද්ධි වර්ගය | සිද්ධි ප්‍රමාණය |
|---|---|---|
| 01 | වෛරී ප්‍රකාශන | 05 |
| 02 | හිංසන සහ හිරිහැර කිරීම් | 01 |
| 03 | වැරදි තොරතුරු | 01 |
| 04 | වෛරී ප්‍රකාශන, හිංසන සහ හිරිහැර කිරීම් | 08 |
| 05 | බාලවයස්කරුවන් යොදාගැනීම | 12 |
| 06 | වෛරී ප්‍රකාශන, ඡන්ද මර්දනය | 01 |
| 07 | මහජන පීඩනය | 01 |
| 08 | ජාතික ගීය, ජාතික කොඩිය, ආගමික සංකේත සහ ආගමික ස්ථාන භාවිතය | 11 |
| 09 | රාජ්‍ය නිලධාරීන්ට අදාළ මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීම | 01 |
| 10 | ප්‍රචණ්ඩත්වය සහ උසිගැන්වීම | 14 |
| 11 | ඡන්ද මිලට ගැනීම | 01 |

*වගුව 3 ඔක්තෝබර් 12 සිට 30 දක්වා සමාජ මාධ්‍ය නිරීක්ෂණ සිද්ධි කාණ්ඩ සහ සිද්ධීන් ගණන*

හැශ්ටැග් පරපුර පැෆ්රල් සංවිධානය හා එක්ව මැතිවරණ කාලය පුරාවටම සමාජ මාධ්‍ය නිරීක්ෂණ කටයුතු කරගෙන යයි.

## 2. 5 මැතිවරණ ප්‍රචාරණ වියදම් නිරීක්ෂණය

පාර්ලිමේන්තු මැතිවරණය 2024 සඳහා තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ ,ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් 2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වෙනි වගන්තිය ප්‍රකාරව මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කළ හැකි වියදම් සීමාව පහත පරිදි තීරණය කර ඇති බව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිවේදනය කොට ඇත.

| අංකය | මැතිවරණ කොට්ඨාසය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | එක් ඡන්දහිමියෙකුට වැය කළ හැකි මුදල (රු. ) | සමස්ත උපරිම වියදම් සීමාව (රු. ) | එක් අපේක්ෂකයෙකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු. ) | පක්ෂයකට /ස්වාධීන කණ්ඩායමකට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු. ) | ජාතික ලැයිස්තු අපේක්ෂකයෙකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු. ) |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 1765351 | 114 | 201,250,014 | 5,750,000 | 79,493,756 | 34,698 |
| 2 | ගම්පහ | 1881129 | 110 | 206,924,190 | 5,643,387 | 81,735,055 | 35,677 |
| 3 | කළුතර | 1024244 | 108 | 110,618,352 | 4,740,787 | 43,694,249 | 19,072 |
| 4 | මහනුවර | 1191399 | 108 | 128,671,092 | 5,146,844 | 50,825,081 | 22,185 |
| 5 | මාතලේ | 429991 | 107 | 46,009,037 | 3,450,678 | 18,173,570 | 7,933 |
| 6 | නුවරඑළිය | 605292 | 110 | 66,582,120 | 3,631,752 | 26,299,937 | 11,480 |
| 7 | ගාල්ල | 903163 | 109 | 98,444,767 | 4,922,238 | 38,885,683 | 16,973 |
| 8 | මාතර | 686175 | 109 | 74,793,075 | 4,487,585 | 29,543,265 | 12,895 |
| 9 | හම්බන්තොට | 520940 | 111 | 57,424,340 | 3,469,460 | 22,840,614 | 9,970 |
| 10 | යාපනය | 293187 | 100 | 59,318,700 | 3,954,580 | 23,430,887 | 10,227 |
| 11 | වන්නිය | 306081 | 82 | 25,098,642 | 1,673,243 | 9,913,964 | 4,327 |
| 12 | මඩකලපුව | 449686 | 110 | 59,465,460 | 3,709,910 | 19,538,857 | 8,529 |
| 13 | දිගාමඩුල්ල | 555432 | 113 | 62,763,816 | 3,765,829 | 24,791,707 | 10,821 |
| 14 | ත්‍රිකුණාමලය | 315925 | 115 | 36,331,375 | 3,114,118 | 14,350,893 | 6,264 |
| 15 | කුරුණෑගල | 1417226 | 107 | 151,643,182 | 5,054,773 | 59,899,057 | 26,145 |
| 16 | පුත්තලම | 663673 | 109 | 72,340,357 | 3,945,838 | 28,574,441 | 12,472 |
| 17 | අනුරාධපුර | 741862 | 110 | 81,604,820 | 4,080,241 | 32,233,904 | 14,070 |
| 18 | පොලොන්නරුව | 351302 | 109 | 38,291,918 | 2,871,894 | 15,125,308 | 6,602 |
| 19 | බදුල්ල | 705772 | 109 | 76,929,148 | 3,846,457 | 30,387,013 | 13,264 |
| 20 | මොනරාගල | 399166 | 110 | 43,908,260 | 2,927,217 | 17,343,763 | 7,570 |
| 21 | රත්නපුරය | 923736 | 110 | 101,610,960 | 4,354,755 | 40,136,329 | 17,519 |
| 22 | කෑගල්ල | 709622 | 108 | 76,639,176 | 3,831,959 | 30,272,475 | 13,214 |

*වගුව 4 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් සීමාවන්*

මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර දින විසි එකක් (21) ඇතුළත අපේක්ෂකයන් සියලු මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළුව වියදම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අතිරේක වශයෙන්, අපේක්ෂකයා වෙනුවෙන් ලැබෙන ඕනෑම පරිත්‍යාගයක් හෝ දායකත්වයක්, ඒවායේ ඇස්තමේන්තුගත වටිනාකමක් ලැබී ඇත්නම් ඒවා වාර්තා කළ යුතුය. දායක මුදල් තෑගි, ණය, අත්තිකාරම් හෝ තැන්පතු ලෙස ලබා දුන්නේද යන්න සඳහන් කළ යුතුය.

පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂකයින් තම ප්‍රචාරක අරමුදල් වෙන් කර ඇති සීමාවන් තුළ වියදම් කරන්නේද යන්න සොයා බැලීම සඳහා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL), හැශ්ටැග් පරපුර (Hashtag Generation), නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ව්‍යාපාරය (CaFFE) ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ සහ මැතිවරණ අධ්‍යයන ආයතනය (IRES) සහ පැෆ්රල් සංවිධානය ඇතුළු විවිධ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් සහයෝගී ප්‍රයත්නයක් දරයි .

මේ අනුව, අපේක්ෂකයින් සහ දේශපාලන පක්ෂවල ප්‍රචාරක වියදම් අධීක්ෂණය, ඇස්තමේන්තු කිරීම සහ විශ්ලේෂණය කිරීමේ අරමුණින් 2024 ජනාධිපතිවරණයේ සිට "ඡන්ද සල්ලි මීටරේ" නම් වූ මෙවලමක් හඳුන්වා දී ඇත. මෙම විශේෂිත වෙබ් අඩවිය හරහා, මැතිවරණ නිරීක්ෂණ ආයතනවල ඒකාබද්ධව, මැතිවරණ ව්‍යාපාරවල මූල්‍ය භූමිකාව සහ ඡන්දදායකයින්ගේ තීරණ කෙරෙහි එහි බලපෑම පිළිබඳ මහජන දැනුම ඉහළ නැංවීමෙන් මැතිවරණ ප්‍රචාරක මූල්‍ය නිරීක්ෂණ කටයුතු සඳහා පුරවැසියන් සම්බන්ධ කර ගැනීමට සහාය වේ.

මාතලේ, පොළොන්නරුව, ගාල්ල, මාතර සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල මැතිවරණ කොට්ඨාශ 32 ක අපේක්ෂකයින්ගේ වියදම් නිරීක්ෂණය කිරීමට සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය, සමාජ මාධ්‍ය, පොදු ප්‍රචාරණ, පොදු සිදුවීම්, මාධ්‍ය සාකච්ඡා, සමාරම්භක උත්සව සහ ප්‍රචාරක කාර්යාල වැනි කාණ්ඩ කිහිපයක් පිළිබඳ සවිස්තරාත්මක දත්ත සැපයීමට පැෆ්රල් සංවිධානය විසින් නිරීක්ෂකයින් 32 දෙනෙකු පුහුණු කර ඇත.

2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා, පැෆ්රල් විසින් තෝරාගත් දේශපාලන පක්ෂවල එනම් සමගි ජන බලවේගය, ජාතික ජන බලවේගය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ, සර්වජන බලය, සහ එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී හඬ යන දේශපාලන පක්ෂවල ප්‍රචාරක මූල්‍ය කටයුතු නිරීක්ෂණය කරනු ලැබේ. මෙම දේශපාලන පක්ෂ පහත නිර්ණායකය මත තෝරාගෙන ඇත:

- පසුගිය පාර්ලිමේන්තුවේ ආසන ලබා ගන්නා දේශපාලන පක්ෂ
- ජනාධිපතිවරණයේදී ඉහළ මට්ටමේ ඡන්ද ප්‍රමාණයක් ලබා ගැනීම
- ඡන්ද සල්ලි මීටරේ මෙවලමට යටතේ ඉහළ වියදම් මට්ටම් සහිත දේශපාලන පක්ෂ

මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණ සහ ප්‍රචාරක කටයුතුවලදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ගෙනහැර දක්වමින් මාර්ගෝපදේශ නිකුත් කර ඇත. මැතිවරණ කාර්යාලවල ප්‍රචාරක කටයුතු සීමා කිරීම මෙන්ම ප්‍රචාරක ක්‍රම සහ රැස්වීම් පිළිබඳ නීති ද ඊට ඇතුළත් ය. මීට අමතරව, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73(1) සහ 73(2) උප වගන්තිවලට අනුව මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතා විස්තර කෙරෙන නිවේදනයක් ද කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇත.


## 3. පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකය

ඕනෑම පැමිණිල්ලක් ඉතා කඩිනමින් අධීක්ෂණය කිරීමට, ලැබීමට සහ හැසිරවීමට කැපවූ මැතිවරණ පැමිණිලි ඒකකයක් පැෆ්රල් සංවිධානය මගින් පිහිටුවා ඇත. පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නාමයෝජනා කැඳවීමට පෙර මෙම ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු යෙදූ අතර, මෙම ඒකකය පශ්චාත් මැතිවරණ කාලය අවසන් වනතුරු ක්‍රියාත්මක වේ.

මෙම ඒකකයට පුරවැසියන්, පැෆ්රල් සංවිධානය මගින් යොදවා ඇති ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයින් සහ දේශපාලන පක්ෂ, මාධ්‍ය නාලිකා (මහජන සහ සමාජ) වෙතින් ලැබෙන සියලුම පැමිණිලි සත්‍යාපනය කර, තහවුරු කර අවශ්‍ය පසු විපරම් සහ විසඳීම සඳහා සුදුසු බලධාරීන් සහ ආයතන වෙත යොමු කරනු ලැබේ. පැෆ්රල් සංවිධානය ඔවුන්ගේ පැමිණිලි, ඒවායේ අදාළත්වය අනුව, පොලිස් දෙපාර්තමේන්තුවට, මැතිවරණ කොමිෂමට, අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කරයි. පැෆ්රල් සංවිධානය විසින් මෙම ආයතනවලට ඔවුන්ගේ විමර්ශන සිදුකිරීමට සහාය වන අතර, පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සහ අවශ්‍ය නම් නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව අවශ්‍ය අවම කිරීම් සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගනු ඇත.

### 3.1 මැතිවරණ පැමිණිලි

2024 ඔක්තෝබර් 11 සිට 30 දක්වා පැමිණිලි 972ක් පැෆ්රල් සංවිධානයට ලැබී ඇත (ඇමුණුම I). මෙම පැමිණිලි, මැතිවරණ නීති උල්ලංඝණය කිරීම, රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන් අයුතු ලෙස භාවිත කිරීම සහ ප්‍රචණ්ඩ ක්‍රියා දක්වා විහිදේ. මින් පැමිණිලි 946 ක් තහවුරු කර ඇති අතර, පැමිණිලි 26ක් තහවුරු කර නොමැත.




*රූප සටහන 1 2024 ඔක්තෝබර් 11 සිට 30 දක්වා පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකයට ලැබුණු මැතිවරණ පැමිණිලි*

### 3.2 මැතිවරණ නීති උල්ලංඝණය කිරීම

මෙම කාලය තුළ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් පැමිණිලි 946ක් (තහවුරු වූ 923ක් සහ තහවුරු නොකළ 23ක්) ලැබී ඇත. ඒ අතුරින්, නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් පැමිණිලි 784ක් (වැඩි වශයෙන් වාර්තා වී ඇති පැමිණිලි), නීතිවිරෝධී පක්ෂ කාර්යාල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පැමිණිලි 64ක්, දේශපාලන අරමුණු සහිත දිරිගැන්වීම් ලබා දීම සම්බන්ධයෙන් පැමිණිලි 51ක්, මහජනතාවට හිරිහැර හා අපහසුතාවයට පත්වන මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් පැමිණිලි 07ක්, රාජ්‍ය නිලධාරීන් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීම සහ රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන් පැමිණිලි 06ක්, නීති විරෝධී රැස්වීම් සහ පෙළපාලි පැවැත්වීම ගැන පැමිණිලි 03ක්, ඡන්දදායකයින්ට සංග්‍රහ කිරීම සම්බන්ධයෙන් පැමිණිලි 02ක්, ඡන්දදායකයින්ට බලපෑම් කිරීම ගැන එක් පැමිණිල්ලක් සහ තවත් සිදුවීම් 03 ක් වාර්තා වී ඇත.

### 3.3 රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන් අයුතු ලෙස භාවිතය

රාජ්‍ය බලය, සම්පත් සහ සේවකයන් අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් පැමිණිලි 10ක් වාර්තා වී තිබේ. 2024 ජනාධිපතිවරණයට සාපේක්ෂව, මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ පූර්ව මැතිවරණ කාලය තුළ රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන් අයුතු ලෙස භාවිතය කිරීම පිළිබඳව දැනට ලැබී ඇත්තේ අඩු පැමිණිලි සංඛ්‍යාවක් වීම විශේෂත්වයකි.

### 3.4 ප්‍රචණ්ඩ ක්‍රියා

2024 ඔක්තෝබර් 11 සිට 30 දක්වා ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි 16ක් ලැබී ඇත. ඒ අතුරින් වාර්තා වූ බරපතල ගණයේ සිදුවීම් පහත පරිදි දැක්විය හැකිය.

- හක්මන බඩබැද්ද ප්‍රදේශයේදී ජාතික ජන බලවේගයේ තරුණ සංවිධානයේ සංවිධායකයෙකු විසින් මාධ්‍යවේදියෙකුට පහරදීමක් සම්බන්ධයෙන් වාර්තා වී ඇත. පුවත්පතක පළවූ ලිපියක් සම්බන්ධයෙන් කළ විමසීමකදීයි මෙම පහරදීම සිදු වී ඇත්තේ. ජාතික ජන බලවේගය විසින් පවත්වන ලද රැස්වීමක් අවසානයේ එය සිදු වූ අතර, පහරකෑමට ලක්ව ඇත්තේ පැෆ්රල් සංවිධානයේ දිගුකාලීන නිරීක්ෂකයෙකි. තුවාලකරු ගංගොඩගම රජයේ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු තංගල්ල රෝහලට මාරුකර යවා ඇත.
- මඩකලපුව කාත්තන්කුඩි පොලිස් බල ප්‍රදේශයෙන් පහරදීමක් සිදුව ඇති බව වාර්තා වේ. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂකයකුගේ Music College පාර අසලින් ගමන් ගත් මෝටර් රථයට ගල් ප්‍රහාරයක් එල්ල වී එහි ඉදිරිපස ඉදිරිපස වීදුරුව කුඩු වී ගොස් ඇතැයි පැවසේ. සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ද ගොනු කර ඇත. කෙසේ වෙතත්, ජීවිත හානි, බරපතළ තුවාල කිසිවක් වාර්තා වී නොමැත.
- බගවන්තලාව සිරිපුර ප්‍රදේශයේ ජාතික ජන බලවේගයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා තරග කරන අපේක්ෂකයන්ගේ ජය තහවුරු කිරීම සඳහා 2024/10/24 දින බගවන්තලාව සිරිපුර ප්‍රදේශයේ පුද්ගලික උත්සව ශාලාවක රැස්වීමක් පවත්වා ඇති අතර, එම රැස්වීමෙන් අනතුරුව දමිළ ප්‍රගතිශීලී සන්ධානයට සහාය දක්වන ආධාරකරුවන් දෙදෙනෙකු බගවන්තලාව නගරයේ දී ජාතික ජන බලවේගයේ අපේක්ෂකයන්ට ඡන්දය ඉල්ලා වතුකරයට පැමිණියහොත්, එසේ පැමිණෙන පිරිස් කපා කොට මරා දමන බවට තර්ජනය කර ඇති බවට පැමිණිල්ලක් ලැබී තිබේ. ඒ පිළිබඳව බගවන්තාලව පොලීසියට පැමිණිලි කර ඇත.

## 4. දැනගෙන දෙන්න (Know Your Candidates)

පැෆ්රල් සංවිධානය, මාර්තු 12 ව්‍යාපාරය සහ Bhasha Lanka පුද්ගලික ආයතනය අතර හවුල්කාරිත්වයක් හරහා 2024 ඔක්තෝම්බර් 11 වන දින 'දැනගන්න දෙන්න' නම් වේදිකාවක් දියත් කරන ලදී. පාර්ලිමේන්තු අපේක්ෂකයින් පිළිබඳ ඔවුන්ගේ සුදුසුකම්, වර්තමාන ගැටලුවලට විසඳුම් සහ අදාළ පාර්ශ්ව පිළිබඳ තොරතුරු සඳහා ඍජු ප්‍රවේශය ලබා දීම අරමුණු කරගත් 'දැනගන්න දෙන්න' ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා මෙම පාර්ශ්වයන් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

පාර්ලිමේන්තු අපේක්ෂකයින් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සැපයීම සඳහා ඡන්දදායකයින්ට පහසු ප්‍රවේශයක් ලබා දීමෙන්, පුරවැසියන්ට ඔවුන්ගේ සුදුසුකම්, දේශපාලන න්‍යාය පත්‍ර සහ පවතින ගැටලුවලට විසඳුම් මත පදනම්ව ඇගයීමට අවස්ථාව ලබා දීම මෙහිදී සිදු වෙයි. මෙම මුලපිරීම ඡන්දදායකයින්ට

දැනුවත්භාවයෙන් තීරණ ගැනීමට උපකාරවනවා පමණක් නොව, මැතිවරණට ඉදිරිපත්වන දේශපාලන අපේක්ෂකයින් අතර වගවීම දිරිමත් කරයි.

ශ්‍රී ලාංකික පුරවැසියන් බහුලව භාවිතා කරන හෙළකුරු ඩිජිටල් වේදිකාව ඔස්සේ, අපේක්ෂකයින්ට ඔවුන්ගේ මනාප අංක සහ පුද්ගලික තොරතුරු බෙදාහදා ගැනීමට අගනා අවස්ථාවක් ලබා දෙමින් ඔවුන්ගේ මහජන සම්බන්ධතාව වැඩි දියුණු කරයි. එය ඡන්දදායකයින්ට අපේක්ෂකයින් ගැන ඉගෙන ගැනීමට අත්‍යවශ්‍ය සබැඳි මෙවලමක් ලෙසද ක්‍රියා කරයි.

මෙය ඡන්දදායකයින් සහ අපේක්ෂකයින් අතර මනා සම්බන්ධකයක් ලෙස ක්‍රියා කරන අතර, විනිවිදභාවය සහ දේශපාලන පක්ෂ විසින් සුදුසුකම් සහිත පුද්ගලයන් නම් කිරීමට දිරිමත් කිරීමක් ද මේ හරහා සිදුවෙයි. මෙම මුලපිරීම ශ්‍රී ලංකාවේ ඕනෑම දෙයක් සඳහා ගැළපෙන ඩිජිටල් විසඳුමක් ලෙස සලකුණු කළ හැකිය.

## 5. සියලු දෙනා ඇතුළත් කරගන්නා මැතිවරණයක් තහවුරු කිරීම

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා පැෆ්රල් සංවිධානය සිය මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම අඛණ්ඩව පවත්වාගෙන යයි. මැතිවරණවලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සක්‍රිය කරමින් සියලුම පුරවැසියන් ඇතුළත් මැතිවරණයක් වෙනුවෙන් ගන්නා ප්‍රයත්නයක් ලෙස ස්ථිර ආබාධ සහිත පුද්ගලයන් සඳහා මැතිවරණ හැඳුනුම්පත් ලබාදීමට පැෆ්රල් සංවිධානය කටයුතු කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාව විසින් ස්ථිර ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ විය හැකි මාර්ග, දෘශ්‍යාබාධිත අයට ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුව සහ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සඳහා අවධානය යොමු කොට ඇත.

ඉදිරි මැතිවරණවලදී පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් දෘෂ්‍යාබාධිත හෝ ශාරීරික ආබාධ සහිත පුද්ගලයන්ට ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීමට සහය වීම සඳහා වෙනත් අයෙකු ගමන් කිරීමට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ප්‍රධාන ප්‍රඥප්තියේ 40 (2) උප වගන්තියේ නීතිමය ප්‍රතිපාදන හරහා එම පහසුකම ලබා දී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව ප්‍රකාශ කොට ඇත .

එමෙන්ම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ පස්වන උපලේඛනයේ දක්වා ඇති සුදුසුකම් පිළිබඳ සහතිකයක් ඡන්ද මධ්‍යස්ථානයේ නිලධාරීන් වෙත භාර දිය යුතු බව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024/10/18 වන දින ශාරීරික ආබාධ සහිත පුද්ගලයින් වෙත විශේෂ ප්‍රවාහන පහසුකම් ලබාගැනීම සඳහාවන අයදුම්පත පිළිබඳව මාධ්‍ය නිවේදනයක් ද නිකුත් කරන ලදී. දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල හෝ www.elections.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි මෙම අයදුම්පත්‍රය හරහා මෙම පහසුකම ලබා ගත හැක.

## 6. ඡන්දදායකයන් දැනුවත් කිරීමේ වැඩසටහන්

දේශපාලන සංස්කෘතියේ ප්‍රගමනය සඳහා සමාජය දැනුවත් කිරීමේ අරමුණින් පැෆ්රල් සංවිධානය විසින් රට පුරා ඡන්දදායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි. මෙය වසර ගණනාවක් තිස්සේ සිදු කරනු ලබන අඛණ්ඩ ක්‍රියාවලියකි. මෙම වැඩසටහන පවත්වනු ලබන්නේ පළමු වරට ඡන්දය භාවිත කරන්නන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, සාමාන්‍ය පුරවැසියන්, රාජ්‍ය නිලධාරීන් යනාදිය කණ්ඩායම් ඉලක්ක කර ගනිමිනි. මෙහිදී ඉලක්ක කණ්ඩායම්වලට මැතිවරණ දිනයේ ඔවුනට පවතින ඡන්ද දායකයාගේ වගකීම්, ඡන්දය දැමීමේ ක්‍රියා පටිපාටිය, ඡන්ද මධ්‍යස්ථාන ක්‍රියාවලිය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දේ.

2024 පාර්ලිමේන්තු මැතිවරණය ඉලක්ක කර ගනිමින් පැෆ්රල් සංවිධානය ඡන්දදායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 1500 ක පමණ සහභාගීත්වයෙන් කොළඹ, කළුතර, ගාල්ල, කෑගල්ල, රත්නපුර, බදුල්ල, පොළොන්නරුව, යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, පුත්තලම, මහනුවර, අම්පාර, සහ වව්නියා යන දිස්ත්‍රික්ක ආවරණයවන පරිදී වැඩසටහන් පවත්වා ඇත. මෙම වැඩසටහන් මෙහෙයවීම සඳහා ඡන්දදායකයින් දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ විශේෂඥයන්ගෙන් සහ මාර්තු 12 ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයින්ගෙන් සම්පත් දායකත්වය ලබා ගනී.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගී වීම සඳහා පුරවැසියන් දිරිමත් කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක වැදගත්කම මෙම දැනුවත් කිරීමේ සැසි මගින් ආවරණයවන බව පැෆ්රල් සංවිධානය විශ්වාස කරයි. මේ මගින් එක් එක් මැතිවරණයේ වැදගත්කම, මැතිවරණ සම්බන්ධ නීතිමය රාමුව සහ මැතිවරණ වංචා වැළැක්වීමේ වැදගත්කම අවධාරණය කරයි. මෙම ප්‍රයත්නයි තුළින් ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් සඳහා දායක විය හැකි වඩාත් දැනුවත් ඡන්දදායකයින් පෝෂණය කිරීම සංවිධානයේ අරමුණයි.

## 7. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතාවගේ වගකීම

පැෆ්රල් සංවිධානය මැතිවරණයට පෙර, ඒ අතරතුර සහ පශ්චාත් මැතිවරණ අක්‍රමිකතා සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව පියවර ගන්නා ලෙස ජනතාව දිරිමත් කරයි. තවද, පැෆ්රල් සංවිධානය නිදහස් හා සාධාරණ මැතිවරණයක් අපේක්ෂා කරන අතර ඒ සඳහා ප්‍රයත්න දරයි. මෙම ප්‍රධාන ඉලක්කය සමගින්, පළාත් පාලන ආයතනවල සිට පළාත් සභා, පාර්ලිමේන්තු සහ ජනාධිපතිවරණය දක්වා දෝෂ රහිත මැතිවරණ ක්‍රියාවලීන් සහතික කිරීම, සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට අදාළ සිද්ධීන් වාර්තා කිරීම සහ ලේඛනගත කිරීම සඳහා ජනතාව විසින් මෙහෙයවනු ලබන අඛණ්ඩ මැතිවරණ නිරීක්ෂණයක් බලමුලු ගැන්වීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට පැෆ්රල් සංවිධානය අපේක්ෂා කරයි. එසේම මැතිවරණ වලදී සහ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ පූර්ව, අතරතුර සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්වය සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා සාමූහික ප්‍රජා මූලික ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීමට මෙන්ම සෑම කෙනෙකුම වගකීමෙන් යුතුව සිය ඡන්ද අයිතිය භාවිතා කිරීම සිදු කරනු ඇතැයි පැෆ්රල් සංවිධානය බලාපොරොත්තු වේ.

## පැෆ්රල් ප්‍රධාන කාර්යාලයේ (දිස්ත්‍රික් මට්ටමින්) පැමිණිලි භාර ගැනීමේ සහ මැදිහත්වීමේ මධ්‍යස්ථානයේ සම්බන්ධතා විස්තර

| දිස්ත්‍රික්කය | දුරකථන අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|
| කොළඹ | 0757427942 | paffrelcomplaintunit@gmail.com |
| ගම්පහ සහ කළුතර | 0701084006 | |
| මහනුවර සහ මාතලේ | 0701083974 | |
| නුවරඑළිය, මඩකලපුව, ත්‍රිකුණාමලය, සහ දිගාමඩුල්ල | 0701083911 | |
| ගාල්ල සහ මාතර | 0701083949 | |
| හම්බන්තොට | 0751227989 | |
| යාපනය සහ වන්නිය | 0701083929 | |
| කුරුණෑගල සහ පුත්තලම | 0701084013 | |
| අනුරාධපුර සහ පොළොන්නරුව | 0701083998 | |
| බදුල්ල සහ මොනරාගල | 0701084034 | |
| රත්නපුර සහ කෑගල්ල | 0701083929 | |

## ඇමතුම් තොරතුරු


නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාමාර්ගය (පැෆ්රල්)
ඇමතුම් තොරතුරු
නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාමාර්ගය (පැෆ්රල්)
අංක 16, බයිර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර , කොළඹ 06
දුරකථන: +94 11 255 8570
වට්සැප්: https://whatsapp.com/channel/0029Va9bCyOLI8YbWO7aaZ0r
විද්‍යුත් තැපැල් ලිපිනය : paffrel@sltnet.lk
ෆෙස්බුක්: https://www.facebook.com/Paffrel.Organization
යූටියුබ් : https://www.youtube.com/channel/UCQtjspli-nTqqTC9fq6DcQQ
වෙබ් අඩවිය: https://www.paffrel.com/paffrel/about-paffrel
ටික්ටොක්: https://www.paffrel.com/paffrel/about-paffrel
ඉන්ස්ටර්ග්‍රෑම්: https://www.instagram.com/paffrel/
ට්විටර්: https://x.com/PAFFREL
ත්‍රෙඩ්ස් : https://www.threads.net/@paffrel

## ඇමුණුම I - 2024/10/11 සිට 2024/10/30 දක්වා පාර්ලිමේන්තු මැතිවරණය ආශ්‍රිතව පැමිණිලි වාර්තා කිරීමේ සහ අවම කිරීමේ ඒකකයට ලැබුණු පැමිණිලි

PAFFREL

**පාර් ලිමේන්තු මැතිවරණය 2024 - පූර්ව මැතිවරණ කාලය**

අදාල සිද්ධි වල මැතිවරණ නීති උල්ලංඝනයන් (දීප ව්‍යාප්තව)

**2024-10-11 10:00:00** සිට **2024-10-30 16:00:00** දක්වා - [පැමිණිලි ලැබුනු දිනය අනුව]

| කාණ්ඩය | සිද්ධින් වලට මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් | තහවුරු කල | තහවුරු නොකල | එකතුව |
|---|---|---|---|---|
| 1 | මනුෂ්‍ය ඝාතන. | 0 | 0 | 0 |
| 2 | බරපතළ පහරදීම්. | 2 | 1 | 3 |
| 3 | පහරදීම්. | 4 | 0 | 4 |
| 4 | පැහැරගෙන යාම්. | 0 | 0 | 0 |
| 5 | බෝම්බ ප්‍රහාර. | 0 | 0 | 0 |
| 6 | වෙඩි තැබීම්. | 0 | 0 | 0 |
| 7 | ගිනි අවි භාවිත කර තර්ජනය කිරීම. | 0 | 0 | 0 |
| 8 | නිශ්චල දේපළ හානි කිරීම. | 1 | 0 | 1 |
| 9 | චංචල දේපල හානි කිරීම. | 1 | 0 | 1 |
| 10 | තර්ජනය කිරීම හා බිය වැද්දීම. | 6 | 1 | 7 |
| 11 | දේශපාලන පක්ෂ කාර්යාල හානි කිරීම්. | 0 | 0 | 0 |
| | **ප්‍රචණ්ඩ ක්‍රියා වල එකතුව.** | **14** | **2** | **16** |
| 12 | රාජ්‍ය බලය සහ දේපල අයුතු ලෙස භාවිතය. | 2 | 0 | 2 |
| 13 | රජයේ වාහන මැතිවරණ කටයුතු සඳහා භාවිත කිරීම. | 0 | 0 | 0 |
| 14 | රාජ්‍ය නිළධාරින්ට බලපෑම් කිරීම. | 2 | 0 | 2 |
| 15 | රාජ්‍ය නිළධාරීන් පත් කිරීම මාරු කිරීම උසස් කිරීම. | 2 | 0 | 2 |
| 16 | රාජ්‍ය නිළධාරින් සහ ආරක්ෂක අංශ දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම . | 2 | 1 | 3 |
| 16-1 | රජයෙන් ලබාදෙන දීමනා ආධාර ද්‍රව්‍ය දේශපාලනික අර්ථයෙන් ලබාදීම. | 1 | 0 | 1 |
| | **රාජ්‍ය බලය දේපළ නිළධාරීන් අයුතු ලෙස භාවිත කිරීම් වල එකතුව.** | **9** | **1** | **10** |
| 17 | කටවුට් සැරසිලි කඩා දැමීම හා ගිනිබත් කිරීම. | 0 | 0 | 0 |
| 18 | දේශපාලන කටයුතු වලට බාධා පැමිණ වීම. | 3 | 0 | 3 |
| 19 | නීති විරෝධී ප්‍රචාරණ කටයුතු. | 784 | 21 | 805 |
| 20 | නිරීක්ෂකයන්ට තර්ජනය කිරීම් හා බාධා කිරීම. | 0 | 0 | 0 |
| 21 | රාජ්‍ය නිලධාරීන් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීම සහ රාජකාරිය පැහැර හැරීම. | 6 | 0 | 6 |
| 22 | නීති විරෝධී රැස්වීම් හා පෙළපාලි. | 3 | 0 | 3 |
| 23 | නීති විරෝධී පක්ෂ කාර්යාල පවත්වාගෙන යාම. | 62 | 2 | 64 |
| 24 | දේශපාලන අරමුණු ඇතිව සංග්‍රහ කිරීම. | 51 | 0 | 51 |
| 25 | අංක තහඩු නොමැති වාහන භාවිතය. | 0 | 0 | 0 |
| 26 | ජනමාධ්‍ය පක්ෂග්‍රාහී සහ අයථා ලෙස භාවිතය. | 0 | 0 | 0 |
| 27 | ආරක්ෂක අංශ හෝ රාජ්‍ය නිළධාරීන් විසින් සිදු කරන බලපෑම්. | 0 | 0 | 0 |
| 28 | අසත්‍ය ප්‍රචාර පැතිරවීම. | 1 | 0 | 1 |
| 29 | මහජනතාවට පීඩනය වන සහ බාධා වන අයුරින් මැතිවරණ කටයුතු සිදු කිරීම සහ බලපෑම් කිරීම. | 7 | 0 | 7 |
| 30 | ඡන්ද දායකයින්ට බලපෑම් කිරීම. | 1 | 0 | 1 |
| 31 | ඡන්ද කාඩ් සම්බන්ධ වැරදි. | 0 | 0 | 0 |
| 32 | ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම. | 0 | 0 | 0 |
| 33 | ඡන්ද දායකයන්ට සංග්‍රහ කිරීම. | 2 | 0 | 2 |
| 34 | ඡන්දපොළ නිළධාරීන්ට සහ කටයුතුවලට බාධා කිරීම. | 0 | 0 | 0 |
| 35 | ඡන්ද දායකයන්ට පහරදීම/පලවා හැරීම. | 0 | 0 | 0 |
| 36 | හොර ඡන්ද දැමීම සහ එයට උත්සහ කිරීම. | 0 | 0 | 0 |
| 37 | වෙනත් සිදුවීම්. | 3 | 0 | 3 |
| | **අනෙකුත් මැතිවරණ නීති උල්ලංඝනයන් වල එකතුව.** | **923** | **23** | **946** |
| | **මුළු එකතුව** | **946** | **26** | **972** |

* සඳහන් කර ඇති කාල පරාසය තුල අප වෙත සිද්ධි **955** ක් ද, මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් **972** ක් ද වාර්තා වී ඇත. (එක් සිද්ධියක් තුළ මැතිවරණ නීති උල්ලංඝනයන් කිහිපයක් තිබිය හැක)